# සාමාන්‍ය සමයේ විසිවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

වීරාවලිය පොතෙන් ගත් පාඨයෙකි.

වීරාවලිය 2:11-19

සමිඳාණන් වහන්සේ පත් කළ වීර නායකයන්ට ඔව්හු සවන් නුදුන් හ.

ඉශ්රායෙල් ජනයා සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි නපුරු දේ කර බාල් දේවතාවන්ට වැඳුම් පිදුම් කළහ. ඔව්හු තමන්ගේ පියවරුන් මිසර දේශයෙන් පිටතට ගෙනා තමන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ අත්හැර අන් දෙවිවරුන් එනම්, තමන් අවට සිටි මනුෂ්‍ය ජාතීන්ගේ දෙවිවරුන් අනුව ගොස් ඔවුන්ට නමස්කාර කළෝය. එසේ කිරීමෙන් ඔව්හු සමිඳාණන් වහන්සේ කෝප කළෝය. ඔව්හු සමිඳාණන් වහන්සේ අත්හැර බාල් දේවතාවාටත්, අෂ්ටාරොත් දේවතාවියටත්, වැඳුම් පිඳුම් කළෝය. සමිඳාණන් වහන්සේගේ උදහස ඉශ්රායෙල්වරුන්ට විරුද්ධව ඇවිළී උන් වහන්සේ ඔවුන් කොල්ලකාරයන් අතට පාවා දුන් සේක. ඔව්හු ද ඔවුන්ගෙන් කොල්ල කෑවෝය. තමන්ගේ සතුරන්ට විරුද්ධව සිටින්නට තවත් ඔවුන්ට නොහැකි වන ලෙස උන් වහන්සේ ඔවුන් වටකර සිටි සතුරන්ගේ අතට ඔවුන් පාවා දුන් සේක. සමිඳාණන් වහන්සේ කී ප්‍රකාරයටත් ඔවුන්ට දිවුළ හැටියටත්, ඔවුන් යුද්ධයට ගිය හැම අවස්ථාවකදී ම උන් වහන්සේගේ හස්තය ඔවුන්ට විරුද්ධව තිබුණේය. ඔව්හු ද තද අමාරුවට පත් වුණෝය.

එවිට ඉශ්රායෙල් සෙනඟ කොල්ල කෑ අයගෙන් ඔවුන් ගලවා ගන්න පිණිස සමිඳාණන් වහන්සේ වීර නායකයන් පත්කළ සේක. එහෙත් ඔව්හු ඒ වීර

නායකයන්ටවත් සවන් නොදී උන් වහන්සේට අවිශ්වාසවන්ත වී අන් දෙවිවරුන් වැළඳ ගෙන ඔවුන්ට නමස්කාර කළෝය. සමිඳාණන් වහන්සේගේ ආඥාවලට කීකරුව සිටි ඔවුන්ගේ පියවරුන් මෙන් ඔව්හු ක්‍රියා නොකොට ඔවුන් ගිය මාර්ගයෙන් වහාම ඉවත්ව ගියෝය. සමිඳාණන් වහන්සේ ඔවුන්ට වීර නායකයන් පත් කර දුන් විට උන් වහන්සේ වීර නායකයන් සමඟ සිට ඔවුන්ගේ මුළු ජීවිත කාලය තුළ ඉශ්රායෙල්වරුන් සතුරන්ගේ අතින් ගැළෙවූ සේක. ඔවුන්ට පීඩා කළාවූ ද ඔවුන් පොඩි කළාවූ ද අය කරණකොටගෙන හටගත් ඔවුන්ගේ කෙඳිරිගෑම නිසා සමිඳාණන් වහන්සේ ඔවුන්ට අනුකම්පා කළ සේක. එහෙත් වීර පුරුෂයෙකු මැරුණු කල ඔව්හු හැරී අන් දෙවිවරුන් අනුව ගොස් ඔවුන්ට වැඳුම් පිදුම් හා නමස්කාර කරමින්, තමන්ගේ පියවරුන්ටත් වඩා දුෂ්‍යකම් කළහ. ඔව්හු ඔවුන්ගේ ක්‍රියාවලින්වත්, මුරණ්ඩුකම්වලින්වත් කිසිවක් අත්නැරියෝ ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 106: 34-37, 39-40, 43-44

පිළිතුර: අහෝ සමිඳුනි, කරුණාවෙන් අප සිහි කළ මැනව.

සමිඳුන් ඔවුන්ට අණ කළ ලෙස ඔව්හු විජාතීන් විනාශ කළෝය. ඔවුන් සමඟ මිශ්‍ර විවාහ කරගෙන විජාතීන්ගේ ක්‍රියා කරන්න ඔව්හු ඉගෙන ගත්තෝය. ඔව්හු ඔවුන්ගේ රූපවලට නමස්කාර කළෝය. ඒවා ඔවුන්ට මළපතක් විය. ඔව්හු තමන්ගේ දරු දැරියන් යක්ෂයන්ට පූජා කළෝය.

මෙසේ ඔව්හු මෙවැනි ක්‍රියාවලින් අපිරිසිදු වූහ. ඔව්හු දෙවිඳුන් හට විශ්වාසීව නොසිට වෙසඟනන් මෙන් හැසිරුණෝය. එබැවින් සමිඳුන්ගේ උදහස තමන් සෙනඟට විරුද්ධව ඇවිළුණෝය. එතුමාණෝ තමන් උරුම කරගත් දේශය පිළිකුල් කළ සේක.

එතුමාණෝ බොහෝවර සිය සෙනඟ මිදූ සේක. එහෙත් ඔව්හු ඉන්පසුත් අකීකරුව කැරලි ගැසූ බැවින්, සිය අයුතුකම නිසා නින්දා කරනු ලැබුවෝය. එසේ වී නමුත් එතුමාණෝ ඔවුන්ගේ විලාපය ඇසූ සේක. ඔවුන්ගේ විපත්තිය සලකා බැලූ සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබවහන්සේගේ ව්‍යවස්ථාව රක්ෂා කිරීමට අපට මනා අවබෝධයක් දුන මැනව.
අපගේ මුළු සිතින් එය පිළිපදින්නෙමු.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය.
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 19: 16 – 22

"ඔබ සර්ව සම්පූර්ණ වන්නට කැමැත්තෙහි නම් සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න."

වරක් එක් මිනිසෙක් ජේසුස් වහන්සේ වෙත අවුත්, "ගුරු දේවයෙනි, සදාතන ජීවනය ලබනු වස්, මා කුමන යහපතක් කළයුතු දැ"යි උන්වහන්සේගෙන් ඇසීය. උන්වහන්සේ පිළිතුරු දෙමින් "ඔබ යහපත ගැන මාගෙන් විචාරන්නේ මන්ද? යහපත්ව සිටින්නේ එකම එක කෙනෙකි. එහෙත් ඔබ ජීවනයට ඇතුල් වන්නට කැමැත්තෙහි නම් ආඥා පිළිපදින්නැ"යි ඔහුට වදාළ සේක. "කොයි ආඥා දැ"යි ඔහු උන්වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "මිනී නොමරන්න. කාමමිථ්‍යාචාරය නොකරන්න. සොරකම් නොකරන්න. බොරු සාක්ෂි නොකියන්න. නුඹේ පියාට ද මවට ද ගෞරව කරන්න. නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න යන මේවා ය"යි වදාළ සේක.

තරුණයා කතා කරමින් "මේ සියල්ලක්ම පිළිපැදිමි. තව මට අඩු කිමෙක්දැ"යි උන්වහන්සේගෙන් ඇසීය. උන්වහන්සේ පිළිතුරු දෙමින්, "ඔබ සර්ව සම්පූර්ණ වන්න කැමැත්තෙහි නම් ගොස් ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න. එවිට ස්වර්ගයෙහි ඔබට සම්පත් ඇති වන්නේය. එන්න, ඔබ මා අනුගාමී වන්නැ"යි ඔහුට වදාළ සේක. එහෙත් ඒ තරුණයා ඒ කීම අසා දොම්නස් සිතින් යන්නට ගියේය. මන්ද, ඔහු බොහෝ ධන සම්පත් ඇති කෙනෙකු වූ බැවිනි.

සුවිශේෂ වාක්‍යය එසේය.